# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021 = 100) : 2023 ජූනි


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk


ජාතික පාරිභෝගික මිල දර්ශකයේ 2013=100 වූ දර්ශක යොමු කාලය 2023 ජනවාරි මාසයේ සිට 2021=100 වන නව දර්ශක යොමු කාලයට යාවත්කාලීන කර ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2023 ජූනි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 10.8%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2023 මැයි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 22.1%ක් ලෙස වාර්තා විය. 2023 ජූනි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 1.2%ක හා ආහාර නොවන කාණ්ඩයේ 9.6%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. 2022 ජූනි මාසයට සාපේක්ෂව 2023 ජූනි මාසයේ උද්ධමනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර හා ආහාර නොවන කාණ්ඩවල පැවති ඉහළ මිල මට්ටම් ය. කෙසේ වෙතත් ආහාර කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2023 මැයි මාසයේදී 15.8% සිට 2023 ජූනි මාසයේදී 2.5% දක්වා අඩු වූ අතර, ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2023 මැයි මාසයේදී 27.6% සිට 2023 ජූනි මාසයේදී 18.3% දක්වා අඩුවිය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2021=100) මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2023 මැයි මාසයේ 203.1ක් වූ දර්ශකාංකය 2023 ජූනි මාසයේ දී 203.3ක් දක්වා වැඩිවීමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කල විට 2023 ජූනි මාසයේ දර්ශකාංකය 0.2ක වැඩිවීමක් එනම් 0.07ක ප්‍රතිශතාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.44% කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.37% කින් අඩුවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකුවිට එළවළු, අළුත් මාළු, කුකුළු මස්, අමුමිරිස්, කරවල, තේ කොළ/කුඩු, බිත්තර, සුදුළූණු, අර්තාපල්, රතුළූණු, ඉඟුරු, දෙහි, දෙල් සහ මඤ්ඤොක්කා යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි වැඩිවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත. එහෙත් කිරිපිටි, සහල්, අළුත් පළතුරු, පොල්, සීනි, මයිසූර් පරිප්පු, බිස්කට්, පොල්තෙල්, මිරිස්කුඩු, වියළි මිරිස්, පාන්(සාමාන්‍ය), මුංඇට, තිරිඟුපිටි, කහකුඩු, කඩල, ටින්මාළු සහ ලොකුළූණු යන ආහාර ද්‍රව්‍ය වල මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2023 ජූනි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය අඩුවීම සඳහා 'රෙදිපිළි හා පාවහන්' (*පාවහන්*), 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' (*ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය හා එල්.පී. ගෑස්*), 'ප්‍රවාහන' (*පෙට්‍රල්*) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එහෙත් 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත. තවද පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'සෞඛ්‍ය', 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ 'විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇති අතර 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු අඩුවීමක් වාර්තා වී ඇත. එමෙන්ම 'අධ්‍යාපන', සහ 'සන්නිවේදන' කාණ්ඩ වලට අයත් අයිතමයන්ගේ මිල ජූනි මාසය පුරා නොවෙනස්ව පැවති බව වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පාද වර්ෂය: 2021=100) ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation), 2023 මැයි මාසයේ 21.6% සිට 2023 ජූනි මාසයේදී 11.3% දක්වා අඩුවීමක් වාර්තා විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකය, ජාතික පාරිභෝගික මිල දර්ශකය (යටිදැරි) සහ
ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, ලක්ෂ්‍යමය යටිදැරි උද්ධමනය (පදනම 2021=100) - විචලනය




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2021 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2022** | ජූනි | 183.5 | 222.8 | 158.2 | 167.5 | 10.3 | 8.4 | | | | |
| | ජූලි | 193.1 | 233.4 | 167.1 | 176.8 | 5.2 | 5.6 | | | | |
| | අගෝ. | 197.7 | 237.5 | 171.9 | 181.2 | 2.4 | 2.5 | | | | |
| | සැප්. | 201.9 | 239.1 | 178.0 | 185.9 | 2.1 | 2.6 | | | | |
| | ඔක්. | 201.6 | 236.5 | 179.1 | 188.0 | -0.1 | 1.1 | | | | |
| | නොවැ. | 200.3 | 233.2 | 179.1 | 187.8 | -0.6 | -0.1 | | | | |
| | දෙසැ. | 200.4 | 232.4 | 179.8 | 188.0 | 0.0 | 0.1 | | | | |
| **2023** | ජන. | 201.8 | 232.8 | 181.8 | 189.8 | 0.7 | 1.0 | 53.2 | 53.6 | 52.9 | 52.0 |
| | පෙබ. | 204.1 | 228.1 | 188.6 | 189.4 | 1.1 | -0.2 | 53.6 | 49.0 | 57.4 | 50.1 |
| | මාර්තු | 204.8 | 223.2 | 193.0 | 188.1 | 0.3 | -0.7 | 49.2 | 42.3 | 54.9 | 44.2 |
| | අප්‍රේල් | 202.7 | 223.8 | 189.1 | 188.2 | -1.0 | 0.1 | 33.6 | 27.1 | 39.0 | 31.8 |
| | මැයි | 203.1 | 226.1 | 188.3 | 187.8 | 0.2 | -0.2 | 22.1 | 15.8 | 27.6 | 21.6 |
| | ජූනි | 203.3 | 228.4 | 187.1 | 186.5 | 0.1 | -0.7 | 10.8 | 2.5 | 18.3 | 11.3 |